(සියලු හිමිකම් ඇවිරිණි/All Rights Reserved)
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

47 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

සිංහල සාහිත්‍ය රසාස්වාදය	I, II
இலக்கிய நயம் சிங்களம்	I, II
Appreciation of Sinhala Literary Texts	I, II

සිංහල සාහිත්‍ය රසාස්වාදය - II පත්‍රය

* **පළමුවන** ප්‍රශ්නය ද, **2, 3, 4, 5** ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න **දෙකක් ද ඇතුළු වි ප්‍රශ්න තුනකට** පිළිතුරු සපයන්න.
* මෙම පත්‍රය සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු ලියන පොත භාවිත කරන්න.

1. පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන, එවන **200**කින් පමණ රසාස්වාදයක් ලියන්න.

ගොඩේ කන්දේ මූකලාන කම්පා — කරමින්නේ
රුස්සයෙකි රෑ පාළුව බිඳගෙන ඇද — වැලුණේ
අඩ නින්දේ ම පන් පැදුරට උණු කඳුළක් — නැවුණේ
මූකලාන පස් වැටියක් වී හීනෙන් — පෙනුණේ

යස දරුවන් ගෙන ඇකයෙන් නැළුවන් — නොසැලෙන්නේ
දුක් කරදර කෝටියක් ම ගිලගෙන — හිනැහෙන්නේ
සියනින් මෙර විපත කටින මිනිසුන් — දකිමින්නේ
මහා පුරුෂයකු වාගේ කන්ද නැගී — ඉන්නේ

සිරුණු ලොවිය ගම් දොරකඩ සියඹ කර — යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ මඟෙ — නිදියනවා
පැලේ වහල ඇද නැළිලා මාසයක් ම — වෙනවා
පරාල කුනකට අයියා හිරේ නුහු — ලනවා

පොරොව, සියන කලුවරේ ම පණ ආවා — ලෙඩින්නේ
මගෙ ඇඟ උඩ පටිවල් බැඳ කපනු ඉරනු — වැන්නේ
දෙයියන්ගේ මල්ලිලාට දෙවියෝ ම — යාවෙන්නේ
කාන්තාර ගම මායිම් නවත් පුපල් — වෙන්නේ

(අ) මෙම පැදි පෙළට පාදක වූ අන්දැකීම
(ආ) එම අන්දැකීම ප්‍රතිනිර්මාණය සඳහා කවියා යොදා ගත් සිද්ධි හා අවස්ථා
(ඉ) මෙම පද්‍ය පන්තියේ භාෂා භාවිතය
(ඊ) මෙම පද්‍ය නිර්මාණයේ භාවිත ආකෘතිය
(උ) සමාජයේ පවතින ඇතැම් අකටයුතු කෙරෙහි කවියා දක්වන විරෝධය (ලකුණු 06 × 5 = 30යි.)

[සියවැනි පිටුව බලන්න

Updates.lk
Free Sri Lankan past papers & model papers

2. සජීවී අවස්ථා නිරූපණයෙහි ලා සද්ධර්මරත්නාවලී කතුවරයා සතු හැකියාව නන්ද තෙරුන් වහන්සේගේ වස්තුවෙන් උදාහරණ **තුනක්වත්** සපයමින් පහදන්න. (ලකුණු 15යි.)

3. දේශාභිමානී හැඟීම් දැනවීම සඳහා උචිත ලෙස බස හැසිරවීමට 'පුතු ඉපදුණු මේ දෙරණේ' පද්‍ය නිර්මාණයේ රචකයා දැක් වූ සමත්කම නිදසුන් **තුනක්වත්** දෙමින් විමසන්න. (ලකුණු 15යි.)

4. "තම පුතුගේ වියෝව හේතුවෙන් වේදනාවට පත් වූ පියෙකුගේ චරිතය 'වැලපීම' කෙටිකතාවෙන් නිරූපණය වේ." නිදසුන් **තුනක්වත්** ඇසුරින් පහදන්න. (ලකුණු 15යි.)

5. "මහින්ද හිමියෝ, 'යුතුකම' පද්‍ය පන්නියෙන් සමකාලීන සමාජය නියුණු විචාරයට ලක් කරති." නිදසුන් **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 15යි.)

PAST PAPERS WIKI
Updates.lk
Free Sri Lankan past papers & model papers